

# රුසියගෙ දොරකඩ උපන් ගස

## දෙහි

ඇස්වහ, කටවහ, හෝවහ, ඇවොල්, දෙවොල්, හදි, හූනියම් ආදිය සිංහල සමාජයේ සතුරන්ට උපාද්‍ර කිරීමට ගන්නා අභිචාර විධි සේ ගැනේ. මේවා දුර කිරිම සඳහා පැවති විශ්වාසය නම් වින කැපුම හෙවත් සූනියම් කැපීමයි. වින කැපීම සඳහා බහුල වශයෙන් යොදා ගන්නේ දෙහිය. විනදොස හරිනා ගස, රුසියාගෙ තදාරකඩ උපන් ගස වැනි නම් වලින් දෙහි හැඳින්වෙන්නේ එම විශ්වාසය නිසාය. තමාට හූනියමක් සිදුකර ඇතැයි සිතේ තැන්පත් වී ඇති



විටෙක එය දුරු කිරීම සඳහා දෙහි මඩුවක් නැටීම හොඳම අභිචාර විධියයි. හූනියම් සාන්තියේදී දෙහි ගෙඩියේ උපත මෙසේ විස්තර වේ.

මුචලින්ද නා රජුගේ බෑනා වූ මහකෙළ නා රජුගේ දුවනිය හා අනුරාගයෙන් බැඳී සිටි රාහු අසරිඳුට ඇය ආවාහ කර ගැනීමට අවස්ථාව අහිමි වූයේ නා රදුන් ඇය හිරු දෙවියන්ට පාවා දුන් බැවිනි. කෝපයට පත් වූ රාහු රේමස් (රෝහිත මත්ස්‍ය) අවියෙන් නාගයාට පහර දුනි. නා රජුගේ විෂ රාහුගේ අතට ඇතුල් විය. රාහු තම අතේ විෂ උරා හිරු සඳු දෙදෙනා වෙත එල්ලකර යැවීය. හිරු සඳු දෙදෙන සතර මහ දිවයින් වල දෙපසින් ඇද වැටුනාහ. හිරු සඳු වියෝවෙන් සක්වල පුරා අඳුරු විය. දෙවියෝ රැස්ව ඉරු සඳු දෙදෙනාගේ වින දොස් දුරු කරන අන්දම කථිකා කළහ. එම කාර්යය අම්බර සෘෂිවරයාටත් පොම්බර් සෘෂිවරයාටත් පැවරිණි. දේස (දෙහි) ලදොත් වින කපා හැරිය හැකි බව ඔවුහු පැවසූහ.

සක් රජු නිල් මැණිකක් ගෙන තම ධහදියෙන් මැද වළා ගැබ තුලට විසි කළේය. එය පොළවට පතිත වී පසුව නා ලොවට වැටී නා රදුගේ හිසේ වැදුනි. නා රදු එය ගිල්ලේය. නා රජුගේ විෂ කෝෂ වලින් දෙහි රේණුද. දළ වලින් දෙහි ඇටද, නාග විෂෙන් අම්ලයද, සක්‍රයාගේ ධහදියෙන් පැගිරිද පහළ වී නාගයාගේ පෙණ ගොබයෙන් දෙහි ගෙඩිය හට ගත්තේය. සෘෂි වරුන් වෙනුවෙන් දෙහි ගෙනැ ඒමට අනද හිමියෝ නා ලොවට වැඩියහ. නා රජු මිණි කරඬුයෙන් දෙහි ගෙඩිය ගෙන ආනන්ද හිමියන්ට දුනි. සෘෂිවරු එය කුණු වූ එකක් සේ ෂලකා මුහුදට විසි කළහ. එය ලේ මුහුද, ගිරිමුහුද, කිරි මුහුද, නිල් මුහුද, ලවන මුහුද, ගොලුමුහුද ආදී සත් මුහුදු පසුකර දින හතකින් සෘෂිවරුන්ගේ ගේ දොරකඩට පැමිණියේය. එතැනදී එහි ඇට පැළවී නන් දෙසට අතු විහිදුනි. උතුරු අත්තේ නියඟලා ද (ලියදලු), වයඹ අත්තේ කොට තිඹුලාද, ඊශාන අත්තේ අත්තනද, බටහිර අත්තේ නාත්නාරං ද හට ගතී. දකුණු දෙසට විහිදී ගිය අත්තක කරබටු හටගත්තේය. ඉහළට විහිද ගිය අත්තේ දෙහි ගෙඩි නවයක් පලගති. සෘෂිවරු නවදෙනෙක් මේ දෙහි කඩාගෙන වින කපා දින හතකින් හිරු සඳු මුදාගත්හ. ඉන්පසු හටගත් දෙහි පැල රත්පත් නුවර, ඉදිපත්නුවර, දිවයින් සතර, සදෙව්ලොව, බඹලොව ආදී තැන්වලටත් මහ සම්මත රජුගේ නුවරටත් උත්සවාකාරයෙන් ගෙනයනු ලැබීය.

උපතක් කියන්නට
දෙවිඳු අවසර දෙන් මට
දෙපතුල තබන්නට
නැතිව දෙහි ගෙන එන්න කී විට

ආතුරයාගේ දෙපතුල තබන්නට දෙහි සෙවූ බවක් මෙයින් කියැවේ.

මෙසේ දෙහි කැපීමේ යාග සාන්ති කර්මය තුලින් මිනිසාට ඇතිවන වින දොස් පහව යන බව අද පවා සිංහලයෝ විශ්වාස කරති. බැඳි විෂ පහ කිරීමට මන්ත්‍ර ජපකොට දෙහි කැපීම රෝගීන්ට හිතකර විය හැකිය.

"රිරි රැගෙන පුද කරලා යකුනට
මාරු බලා ඇදුරෝ කළ විනයට
වාරු නැතිව ඇඟ කොර පිළියල් දුට
දෑඩිය දෙහි කැපූ ඒ විණ සුන්කොට"

මෙබඳු කවි ගායනා කරමින් මන්ත්‍ර ජපකොට හත් අඩියේ දෙහි කැපීම අණ විණ හදි හූනියම් දුරු කිරීමත් ශාන්තියත් සඳහා ගැමියන් අතර මුල් බැසගත් අභිචාර විදියකි. ඇස්වහ කටවහ දෝෂ සඳහා වතුර මැතිරීමේදී එම වතුර බඳුනට දමන දෙහි අත්ත මැලවී ගියොත් එම දොස් පහව යන බව විශ්වාස කෙරේ. විෂ බැස්සවීම සඳහා දෙහි අත්ත ෂලා බිමට ගසමින් මන්ත්‍ර ජල කිරීම විෂ වෙද ඇදුරන්ගේ උපක්‍රමයකි.

දෙහිවල, දෙහිඅත්තකණ්ඩිය, දෙහිඕවිට, දෙහිගම, දෙහිපෙ වැනි ග්‍රාම නාම දෙහි නිසා ඇති වූ බව පෙනේ. දෙහි පැඟිරි වර්ගයේ ගසකි. දොඩම්, නාරම්, යකිනාරම්, නත්නාරම්, ඔඩ්ඩිදෙහි, කූඩලුදෙහි, ජම්බල ආදී පැඟිරි වර්ග අතර මිනිස් කටයුතු කෙරෙහි වැඩි සබඳතා ඇත්තේ දෙහි ගසටය. ආයුර්වේදයේ නිම්බුක නමින් හැඳින්වෙන දෙහිවල -සී" විටමින් අධික බව බටහිර වෛද්‍යවරු පවසති. දෙහි අපේ එදිනෙදා දිවියට අවශ්‍ය දෙයකි. වියලි කලාපයේත් තෙත් කලාපයේත් හැම ගෙවත්තකම වවාගත් දෙහි ගසක් ඇත.
පොල් සම්බලය, ලුණුමිරිස, කිරිහොද්ද, කරවල හොද්ද රසවත් වන්නේ දෙහි ඉස්ම මුසු වූ විටයි. සුලබ කාලයේදී ලුණු දමා වේලාගත් දෙහි බෝතල් වල අසුරා දෙහි ඉස්මද උණුකර දමා තබා ගත් කල එම ලුණුදෙහි දුර්ලභ කාල වලදී ප්‍රයෝජනයට ගත හැකිය.

එදිනෙදා ජීවිතයේදී හදිසි ප්‍රථමාධාර සඳහා දෙහි වලින් ගත හැකි ඵල අධිකය. උදරාබාධ වැළඳුණු කල ඉඟුරු ඉස්මට දෙහි ඇඹුල් දමා හෝ දෙහි ඇඹුලට මී පැණි දමා හෝ බීමෙන් සුවය ලැබේ. තවද එය විජලනය වලක්වාලන හොඳම ඔසුවකි. සර්ප විෂ හරණය සඳහා දෙනු ලබන බෙහෙත් බොහොමයක් අඹරා ගන්නේ දෙහි ඇඹුලෙනි. ආයුර්වේද බෙහෙත් ගුලි, කල්ක බොහෝමයක් අඹරා ගන්නට දෙහි ඇඹුල් යොදා ගැනේ.එමෙන්ම ඇතැම් බෙහෙත් ගුලි හෝ කල්ක බොන්නට දෙන්නේද දෙහි ඇඹුලෙනි. දේශීය වෙදකමේදී නියම කෙරෙන දලු අනුපානට දෙහි දලු යොදා ගැනේ. දෙහි දලු, දෙහි පොතු, දෙහි ගැට, කහ ලුණු ලා කොට මලවා බැඳීමෙන් අත් පා වල ඉදිමුන්, උලුක්කු, තැලීම් ආදිය ගුණ වේ. දෙහි ගෙඩිය පානට අල්ලා අඳුන් බස්සවා ඇස වටා ගෑමෙන් සර්ප විෂ අඩු වේ. අජීර්ණ රෝග සඳහා දෙහි මතුරා දෙනු ලැබේ. සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුණු විට දෙහි කොල තම්බා වේදුපෑම (දුම් ඇල්ලීම), තැවීම සුවදායක වේ. කරප්පන් සෑදී සිරුර කසන විට දෙහි කොළ දුම් ඇල්ලීම හිතකරය.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

රුසියගෙ තදාරකඩ උපන් ගසේයා
රිසි ඇති දලුවෙන් නස්න කෙරේයා
අසි විෂ ගත පැතුරුණු නොලසේයා
බසි රිව්දුටු පිණිබඳු විලසේයා

වින දොස හරිනා කොල පොතු ගන්නේ
වයන කල තිබෙනා වැල් අරගන්නේ
කණයට කුලලේ මිරිස් ලවන්නේ
ගුණයට බෙල්ලට සිවුපාවුන් නේ"

මෙබඳු ඖෂධ සංයෝග සඳහා දෙහි නිතර හිතකර වේ.

දෙහි ඇඹුල් හිස ගා නෑමෙන් කිළි නැති නී පිරිසිදු බවට පත් වේ. දේවාල වලට ඇතුල් වන විට කිළි නැතිවීම සඳහා හිසේ දෙහි ආලේප කෙරේ. දෙහි ඇඹුල් මිශ්‍ර නාන් ගා නෑමෙන් පිරිසිදු වී ඉස්සොරි හා උකුණෝ වඳ වෙති. රාත්‍රියේදී ගෙදරට මෙරු ආ විට කථා නොකර දෙහි අත්තක් කඩා ගෙන විත් එල්ලා තැබීමෙන් උන් ඉවත් වී යන බව විශ්වාස කෙරේ.

"කට දෙහි ලෙල්ල වගෙයි"

"කටට දෙහි මිරිකුවා වැනි"

මෙබඳු ප්‍රස්ථාව පිරුළු දෙහි නිසා අප බසට එක් වී ඇත.

මේ අන්දමින් දෙහි ගසද අපේ සංස්කෘතිය හැඩ ගැන්වීමෙහිලා නන් ලෙසින් සම්බන්ධ වී ඇත.


**ඉඩමක් විකිණීමට තිබේ**

**තිරාණගම - හික්කඩුව**

ප්‍රධාන පාරට මායිම්ව පිහිටි ජල විදුලි දුරකතන පහසුකම් ඇති පර්චස් 103 ක ඉඩමක් විකිණීමට තිබේ. හික්කඩුව කොළඹ පාරට කිලෝ මීටර් 1.5 කි.

විමසීම් **0430 293 260**






**පරිගණක අලුත්වැඩියාව**

Professional Services

# Computer Repairs & Upgrades
# Virus Removals
# ADSL Professional installations
# Networking
# Brand New Computers for sales
# Laptop screen repairs
# Trouble shooting Browsing, E-mail & internet connection issues
# All Computer parts for low price

Jithendra Weerakoon
(IT Consultant)

02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia

M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com